## රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂකවරයා වන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත යුත්තේ ඇයි?

**හිටපු යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක චූල කොඩිතුවක්කු මහතා විසින් නිලන්ත ජයවර්ධන මහතාට විරුද්ධව දිවුරුම් පිට ලබාදී ඇති සාක්ෂි**

1. HC (TAB) 2899/2021 දරණ නඩුවේදී පැමිණිල්ලේ සාක්ෂිකරුවකු වූ හිටපු යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක චූල කොඩිතුවක්කු විසින් සාක්ෂි ලබාදෙමින් කියා සිටියේ එම නඩුවේ පැ 8 දරණ 2019.04.04 දින ලද 'වට්ස්ඇප්' පණිවිඩය රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාව සිටි නිලන්ත ජයවර්ධන මහතා හට ලැබුණු ඉතා වැදගත් තොරතුරක් වුවද, ඒ පිළිබඳව 2009.04.09 වන දින පැවති බුද්ධි සමාලෝචන රැස්වීමේදී අවධානය යොමු කිරීමට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාව සිටි නිලන්ත ජයවර්ධන මහතා පැහැර හරින නමුත් එම කාරණාව ඉදිරිපත් කිරීම සහ සාකච්ඡා කිරීම සඳහා හොඳම සහ සුදුසුම ස්ථානය බුද්ධි සමාලෝචන මණ්ඩලය බවයි.

2. තවද 2019.04.04 දින ලද තොරතුර ඇතුලු තොරතුරු වර්ධනය කරගෙන එහි සත්‍ය අසත්‍යතාවය හෝ එවැන්නක් සිදු වීමට ඇති සම්භාවිතාවය පිළිබඳ අවශ්‍ය අනෙකුත් අය සමග සාකච්ඡාවට බඳුන් කිරීමේ මූලික වගකීම රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් නිලන්ත ජයවර්ධන මහතා සතුව තිබුණු බව චූල කොඩිතුවක්කු මහතාගේ සාක්ෂියෙන් පෙනී යයි.

3. තවද මෙම නඩුවේදී චූල කොඩිතුවක්කු මහතා සාක්ෂි දෙමින් පවසා සිටියේ නිලන්ත ජයවර්ධන මහතා 2019.04.18 දින තමාට දුරකථනයෙන් කතා කරන ලද අවස්ථාවේදී මඩකලපුවේ සිදු වූ පිපිරීමක් සම්බන්ධයෙන් සාකච්ඡා කලද, 2019.04.04 දින ලද තොරතුර සම්බන්ධයෙන් කිසිදු දැනුම් දීමක් නොකළ බවයි. එමෙන්ම ඔහු වැඩිදුරටත් සාක්ෂි ලබාදෙමින් පවසා සිටියේ රාජ්‍ය බුද්ධි සේවය කිසිදු අවස්ථාවක බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීමට උත්සහ නොකළ බවත්, යුධ හමුදා බුද්ධි අංශය සමග රාජ්‍ය බුද්ධි සේවය සහයෝගයෙන් කටයුතු නොකළ බවත් ය.

**HC(TAB)2899/2021 සහ HC(TAB)2900/21 දරණ නඩුවල තීන්දු ලබාදෙමින් විනිශ්චයකාරවරුන් විසින් නිලන්ත ජයවර්ධන මහතාගේ වරදකාරිත්වය හෙළිකර ඇති අවස්ථා**

4. මෙම සාක්ෂි විශ්ලේෂණය කරමින් HC(TAB)2899/2021 දරණ නඩුවේදී එ.කේ.එම්. පටබැඳිගේ විනිසුරුතුමා දක්වා ඇත්තේ 2019.04.04 දරණ තොරතුර බුද්ධි තොරතුරක් බවට පරිවර්තනය කරගැනීම සඳහා හෝ ඒ පිළිබඳ වැඩිදුර විශ්ලේෂණය කිරීම සඳහා නිලධාරීන් යොමු කිරීම පැහැර හැර ඇත්තේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා බවයි.

5. තවද HC(TAB)2900/21 දරණ නඩුවේ ද 2022.02.18 දින දරණ නියෝගය ලබාදෙමින් එ.කේ.එම්. පටබැඳිගේ විනිසුරුතුමා දක්වා ඇත්තේ 2019.04.04 දින දරණ තොරතුර බුද්ධි තොරතුරක් දක්වා වර්ධනය කරගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා යුධ හමුදා බුද්ධි අංශයෙන් හෝ ත්‍රිවිධ හමුදා වල බුද්ධි අංශ වලින් කිසිදු සහයක් ලබාගැනීමට කටයුතු කර නැති බවයි.

**CID අධ්‍යක්ෂ තනතුර හොබවන ලද ශානි අබේසේකර මහතාගේ දිවුරුම් ප්‍රකාශය මගින් නිලන්ත ජයවර්ධන මහතාට එරෙහිව ඉදිරිපත් වන සාක්ෂි**

6. ශ්‍රී ලංකා පොලිසියේ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ (CID) අධ්‍යක්ෂ තනතුර හොබවන ලද දැනට විශ්‍රාම ගොස් සිටින ශානි අබේසේකර මහතා විසින් මෙම ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන ලද අතර ඔහු විසින් පවරා ඇති SCFR 64/2022 දරණ මූලික අයිතිවාසිකම් නඩුවේ පෙත්සමත් සමග ගොනු කර ඇති දිවුරුම් ප්‍රකාශයේ 2019.01.16 හෝ ඊට ආසන්න දිනකදී එනම් පාස්කු ප්‍රහාරය සිදුවීමට මාස 3කට පෙර ලැක්ටෝවත්තේදී අත්අඩංගුවට ගන්නා ලද සහරාන් නායකත්වය දරණ ලද NTJ ත්‍රස්තවාදී සංවිධානයේ සාමාජිකයන් වන සැකකරුවන් 4 දෙනෙකුගෙන් අනාවරණ කරගන්නා ලද කරුණු දැක්වේ. එම අනාවරණය කරගන්නා ලද කරුණු වලට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා අධ්‍යක්ෂක ධූරය දරණ ලද රාජ්‍ය බුද්ධි සේවයේ (SIS) නිලධාරීන්ට ද ප්‍රවේශය තිබුණු බවට මෙම දිවුරුම් ප්‍රකාශයේ දැක්වේ.

7. මේ අනුව සහරාන් සහ NTJ කණ්ඩායම සම්බන්ධයෙන් විශාල දැනුමක් 2019 ජනවාරි මස වන විටත් SIS අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතාට තිබුණු බව ශානි අබේසේකර මහතාගේ මෙම දිවුරුම් පෙත්සමෙන් අනාවරණය වේ. ඒ අනුව මෙවන් දැනුමක් SIS අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතා වෙත තිබුණු පසුබිමක ඔහුට ලැබුණු 2019.04.04 දින දරණ 'වට්ස්ඇප්'පණිවිඩය බරපතල කරුණක් ලෙස සළකා ඒ පිළිබඳව ක්‍රියාත්මක නොවීම ඔහු කෙරෙහි සාධාරණ සැකයක් උපදවයි.

8. මෙම දිවුරුම් ප්‍රකාශයේ 64 වන සම්ප්‍රකාශයේ සඳහන් වන සාක්ෂි වලට අනුව පාස්කු ප්‍රහාරයෙන් පැය කිහිපයකට පසු රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා ලෙස නිලන්ත ජයවර්ධන විසින් ප්‍රථම වරට CID වෙත යවා ඇති NTJ ත්‍රස්තවාදී සංවිධානයේ අණදෙන ව්‍යුහය පිළිබඳ සම්පූර්ණ තොරතුරු සහ වව්නතිව් පොලිස් කොස්තාපල්වරු දෙදෙනා ඝාතනය සම්බන්ධයෙන් සාක්ෂි ඇතුලත් වාර්තාව ත්‍රස්ත ප්‍රහාරය එල්ල කිරීමට පෙර CID වෙත හෝ ආරක්ෂක මණ්ඩලයට නිලන්ත ජයවර්ධන මහතා විසින් ලබාදුන්නේ නම් මෙම ප්‍රහාරය වැලැක්වීමට හැකියාව තිබී ඇත.

**2019.04.04 දින දරණ පාස්කු ප්‍රහාරය පිළිබඳව ලැබුණු 'වට්ස්ඇප්' පණිවිඩය නැවත ස්වාධීන තොරතුරුකරුවෙකු විසින් තහවුරු කර තිබියදීත් නිලන්ත ජයවර්ධන මහතා ක්‍රියාත්මක නොවීම**

9. රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක ලෙස නිලන්ත ජයවර්ධන මහතා හට පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳ 2019.04.04 දින දරණ 'වට්ස්ඇප්' මගින් ලැබුණු පණිවිඩය එම තොරතුරුකරු විසින් නැවතත් ලිඛිතව 2019.04.05 වන දින උදේ 9.00 ට ලබා දී ඇති අතර වෙනත් විදේශීය තොරතුරුකරුවෙකු විසින් ද එදිනම දවල් 12.00 ට ලිඛිතව එම තොරතුර නිලන්ත ජයවර්ධන මහතා හට ලබා දී ඇත. මේ අනුව අදාළ තොරතුර ස්වාධීන තොරතුරුකරුවෙකු විසින් තහවුරු කරන ලද තොරතුරක් වන බැවින් එය විශ්වාසදායක තොරතුරක් බවට පරිවර්තනය කරන ලද්දක් ලෙස සැලකිය යුතුය. එසේ නම් නිලන්ත ජයවර්ධන මහතා මේ පිළිබඳ ක්‍රියාත්මක නොවීම අතිශයින්ම බරපතළ වරදකි.